දෙපාර්තමේන්තු චක්‍රලේඛ: 01/2012

මගේ අංකය: DAPH/AD/5/2
සත්ත්ව නිෂ්පාදනක හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2012.03.21

සියළුම පළාත් අධ්‍යක්ෂ වරුන් වෙත

<u>රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සතුන්ට ප්‍රතිකාර කිරීම</u>

ඉහත කරුණට අදාලව නිකුත්කර ඇති අංක 1986.05.06 දිනැති 164 චක්‍රලේඛයේ හා 2009.12.21 දින දරණ 07/2009 චක්‍රලේඛවල අඩුපාඩු නිරීක්ෂණය වන බැවින්, එම චක්‍රලේඛ අහිබවා 2012. 04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

**පළාත් පශු වෛද්‍ය කාර්යාලවල පශු වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරි වේලාව**

සතියේ දිනවල රාජකාරි ආරම්භ කරන වේලාවේ සිට පැය 7 ½ ක කාලයකි.

සෙනසුරාදා දිනවල රාජකාරි ආරම්භකල වේලාවේ සිට පැය 4 ක් නිමාවන හෝරාව දක්වා කාලයකි

**1. රාජකාරි වේලාවන් තුළ ප්‍රතිකාර කිරීම**

**1.1. කෘෂිකාර්මික සතුන් සඳහා**

රජයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් කෘෂිකාර්මික සතුන් සඳහා රාජකාරි වේලාවන් තුල පශු වෛද්‍ය කාර්යාලයේදී හෝ ජංගම චිකිත්සාගාරවලදී පහත සඳහන් වන ප්‍රතිකාර කටයුතු නොමිලේ කලයුතු වන අතර, මොනයම් අවස්ථාවකදීවත් දෙපාර්තමේන්තු චක්‍රලේඛ වලින් නියමකර ඇති මුදලක් වේ නම් ඒවා හැර වෘත්තිමය හෝ උපදේශක ගාස්තු වශයෙන් කිසිදු මුදල් අයකිරීමක් සිදු නොකල යුතුය.

i. සත්ත්ව රෝග පනතේ නියමිත උපලේඛණගත ආත්ත්ව වසංගත රෝග වලට පශු වෛද්‍ය කාර්යාලයේදී හෝ ක්ෂේත්‍රයේදී කරනු ලබන ප්‍රතිකාර වෙනුවෙන්
ii. එම පනතේ උපලේඛණගත රෝග වලින් වැලකීමට කරනු ලබන නිවාරණ එන්නත් වෙනුවෙන්
iii. කෘෂිකාර්මික සතුන්ගේ කර ඇඹීම වැනි යෝග්‍යතාවන් සඳහා කරනු ලබන ක්‍රියාකාරකම් වෙනුවෙන්
Iv. කෘෂිකාර්මික සතුන්ගේ රෝග පරීක්ෂා කිරීම හා අදාල ප්‍රතිකාර නියම කිරීම වෙනුවෙන්

**1.2 .කෘෂිකාර්මික නොවන සතුන් සඳහා**

රජයේ පශු වෛද්‍ය නිලධාරියෙක් විසින් පශු වෛද්‍ය කාර්යාලයේදී හෝ ක්ෂේත්‍රයේදී රාජකාරි වේලාවන් තුල කෘෂිකාර්මික නොවන සතුන්ගේ රෝග පරීක්ෂාව ,නිර්නය සහ ප්‍රතිකාර කිරීම වෙනුවෙන් උපදේශන ගාස්තු අයකල හැකිවන අතර,එම උපදේශන ගාස්තු පහත පරිදි විය යුතුය.

| | | | |
|---|---|---|---|
| i. | නොමුහුන් සුනඛයන් | - | රු. 50.00 |
| ii. | දෙමුහුන් සහ අනෙකුත් | - | රු. 20.00 |
| iii. | සුරතලයට ඇති කරන පක්ෂීන් | - | රු. 20.00 |
| iv. | අශ්වයින් හා පෝනීන් | - | රු. 100.00 |
| v. | අලි ඇතුන් | - | රු. 250.00 |
| vi. | අනෙකුත් කෘෂිකාර්මික නොවන සතුන් | - | රු 50.00 |

රජයේ පශු වෛද්‍ය නිලධාරියෙකු විසින් ඉටුකරන ඕනෑම ප්‍රතිකාර කිරීමකදී කෘෂිකාර්මික හෝ කෘෂිකාර්මික නොවන සතුන් සඳහා යොදාගත්, රජයෙන් සපයා ඇති ඖෂධ සඳහා, නියමකර ඇති මිලගණන් (නොමිලේ සැපයීමට යම් පළාත් සභාවක් අනුමැතිය ලබාදී ඇත්නම් අදාළ නොවේ) පමණක් ගොවි මහතාගෙන් අයකල යුතුය.

රජයේ පශු වෛද්‍ය නිලධාරියෙකු විසින්, රාජකාරි වේලාවන් තුළ ඉටු කරනු ලබන ඉහත ප්‍රතිකාර කටයුතු සම්බන්ධයෙන් අදාල ගාස්තු අයකර ඒ සඳහා රිසිට් පතක් (පොදු 172) අනිවාර්යයෙන්ම නිකුත්කල යුතුය. එම මුදල නිශ්චිත වූ රාජ්‍ය අදායම් ශිර්ෂයට බැරකල යුතුය.

**02. රාජකාරි වේලාවෙන් පරිබාහිරව ප්‍රතිකාර කිරීම**

**2.1. කෘෂිකාර්මික සතුන් සඳහා**

මෙම දෙපාර්තමේන්තුවේ අංක 164 දරණ චක්‍රලේඛයෙන් පශු වෛද්‍ය නිලධාරීන්ට පෞද්ගලික වෘත්තියේ යෙදීමට වරප්‍රසාද හිමිවී ඇත. සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පරිබාහිරව කරනු ලබන ප්‍රතිකාර යටතේ කෘෂිකාර්මික සතුන් සඳහා ප්‍රතිකාර කිරීමේදී පහත සඳහන් පරිදි අයකිරීම් කල හැකි වන අතර, එහිදී ආයතන සංග්‍රහයේ IX වැනි පරිච්ඡේදයේ 2:2 උප වගන්තියට අනුකූලව කටයුතු කල යුතුය.

| | | |
|---|---|---|
| i. | පශු වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යාල පරිශ්‍රයෙන් බැහැරව පිහිටි පශු වෛද්‍ය නිල නිවසේදී ප්‍රතිකාර කිරීම | - රු .150.00 +ඖෂධ වල වටිනාකම |
| ii. | කාර්යාල පරිශ්‍රයෙන් බැහැර ක්ෂේත්‍රයේදී | - රු .250.00 +ඖෂධ වල වටිනාකම |
| iii. | සුළු ශල්‍යකර්ම සඳහා - තනපුඩුවල ශල්‍ය කර්ම තුවාල ආදිය | - රු. 200.00+ ඖෂධ වල වටිනාකම |
| iv. | උදරච්ඡේද ශල්‍යකර්ම,.රුමිනෝටමි, දුෂ්කර ප්‍රසූතිය හා ගර්භාෂ ප්‍රපතනය | - රු.1000.00+ ඖෂධ වල වටිනාකම |

2.2 පෞද්ගලික ඖෂධ භාවිතා කරන්නේ නම්, එම වටිනාකම රිසිට්පතේ සටහන් විය යුතුය. පෞද්ගලික ඖෂධ සඳහා පෞද්ගලික ලේඛණයක් පවත්වාගත යුතු අතර, එම ඖෂධ කාර්යාල පරිශ්‍රයේ ගබඩා නොකල යුතුය.

2.3. එලෙස ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් වෙනම ලේඛණයක් නඩත්තු කල යුතුය. ඒ සඳහා වන නියමිත මුදල් අයකිරීමේදී පොදු ආකෘති 172 මුදල් කුවිතාන්සියක් හෝ ඊට අදාල පළාත තුළ භාවිතා වන මුදල් කුවිතාන්සියක් නිකුත්කල යුතු අතර, එම මුදල් තැන්පත් ශිර්ෂයට බැරකර ආපසු ගැනීමේදී රික්විෂන්පතක් මගින් මුදල් ලබා ගැනීමට කටයුතු කල යුතුය.

03. රාජකාරි වේලාවෙන් පරිබාහිරව කෘෂිකාර්මික නොවන සතුන්ට ප්‍රතිකාර කිරීමේදී, පශු වෛද්‍ය නිලධාරියෙකු විසින් කාර්යාල පරිශ්‍රය හෝ රජයේ කිසිදු දේපලක් හෝ ඖෂධ හෝ උපකරණ හෝ භාවිතයට ගැනීම නොකල යුතුය.

04. සතුන්ට ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් පළාත් සභාව විසින් යම් නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන ඇත්නම්, එම විෂය පළාත් සභාව වෙත පැවරී ඇති කටයුත්තක් බැවින්, ඒ අනුව කටයුතු කිරීමේ හැකියාව ඇත.

W. K. de S.

වෛද්‍ය ඩබ්ලිව් කේ. ද සිල්වා
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 1. ලේකම්, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය
2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
3. සියළුම අධ්‍යක්ෂ වරුන්
4. සියළුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරුන්
5. විගණකාධිපති